සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | ලංකා ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 03 |
|---|---|---|---|---|---|---|---|

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

උපදෙස් :

- මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහ බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
- කොටස් දෙකටම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස II කොටසේ පිළිතුරු පත්‍ර සමග අමුණා භාර දෙන්න.

## I කොටස

★ අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් පහ සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

(01) 1) ටොලමි 2) කෞටිල්‍ය 3) මෙගස්තිනීස්
4) ප්ලිනි 5) කොස්මස් (.......)

(02) 1) පණ්ඩු 2) තිරිතර 3) දාඨිය
4) පීඨිය 5) චන්ද්‍රභානු (.......)

(03) 1) පරරාජසේකරම් 2) සංකිලි 3) පූවිරාජපණ්ඩාරම්
4) අරිට්ඨකී වෙණ්ඩු පෙරුමාල් 5) එදිරිමානසිංහම් (.......)

(04) 1) සේනාසම්මත වික්‍රමබාහු 2) ජයවීර බණ්ඩාර 3) කරලියද්ද බණ්ඩාර
4) රයිගම් බණ්ඩාර 5) කොනප්පු බණ්ඩාර (.......)

(05) 1) ආනන්ද විද්‍යාලය 2) රාජකීය විද්‍යාලය 3) හින්දු විද්‍යාලය
4) සහිරා විද්‍යාලය 5) ධර්මරාජ විද්‍යාලය (.......)

(06) 1) ෆෙඩ්රික් නෝර්ත් 2) තෝමස් මෙට්ලන්ඩ් 3) රොබට් බ්‍රවුන්රිග්
4) ජෝන් ඩොයිලි 5) එඩ්වඩ් බාන්ස් (.......)

(07) 1) ආලාහන පිරිවෙන 2) මයුරපාද පිරිවෙන 3) විජයබා පිරිවෙන
4) සුනේත්‍රාදේවී පිරිවෙන 5) පද්මාවතී පිරිවෙන (.......)

(08) 1) කෝල්බෲක් 2) මෝගන් 3) විලියම් මැනිං
4) කෲව් මැකලන් 5) ඩොනමෝර් (.......)

(09) 1) ඩී.එස්. සේනානායක 2) ඩඩ්ලි සේනානායක 3) ජෝන් කොතලාවල
4) ඔලිවර් ගුණතිලක 5) එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක (.......)

(10) 1) රාමගෝණ 2) දීඝගාම 3) රෝහණ
4) විජිතගාම 5) උපතිස්සගාම (.......)

★ අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

(11) 1) ඇරිස්ටෝටල් - ඕමුන්ඩෝ
2) ටොලමි - භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය
3) හියුං සාං - ඉන්ඩිකා
4) ෆර්නාඕ ඩි ක්වෙරෝස් - ලංකාධිපත්‍යය
5) ප්‍රොකෝපියස් - පර්සියානු යුද්ධය (.......)

(12) 1) එක්සත් ජාතික පක්ෂය - ඩී.එස්. සේනානායක
2) විප්ලවකාරී සමසමාජ පක්ෂය - පිලිප් ගුණවර්ධන
3) ලංකා සමසමාජ පක්ෂය - එන්.එම්. පෙරේරා
4) සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය - එස්.ජේ.වී. චෙල්වනායගම්
5) ජනතා විමුක්ති පෙරමුණ - රෝහණ විජේවීර (.......)

(13) 1) මුල්ලේරියා සටන - ලොරෙන්සෝ ද අල්මේදා
2) දන්තුරේ සටන - පේරෝ ලෝපේස් ද සූසා
3) බලන සටන - දොන් ජෙරනිමෝ ද අසවේදු
4) රන්දෙනිගල සටන - කොන්ස්තන්තිනූ ද සා
5) ගන්නෝරුව සටන - දියෝගෝද මේලෝ ක්‍රැස්ත්‍රෝ (.......)

(14) 1) විලියම් ග්‍රෙගරි - ජාතික කෞතුගාරය පිහිටුවීම
2) තෝමස් මෙට්ලන්ඩ් - ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවීම
3) එඩ්වඩ් බාන්ස් - ගන්නෝරුව කෝපි වත්තක් ඇරඹීම
4) ටොරින්ටන් සාමි - මාර්ග බද්ද පැනවීම
5) හර්කියුලිස් රොබින්සන් - ගම් සභා ක්‍රමය යළි ස්ථාපිත කිරීම (.......)

(15) 1) මිහින්තලා පුවරු ලිපිය - 4 වන මිහිඳු රජු
2) අඹගමුව සෙල්ලිපිය - I වන විජයබාහු රජු
3) දෙවනගල පර්වත ලිපිය - I වන පරාක්‍රමබාහු රජු
4) දඹුලු සෙල්ලිපිය - නිශ්ශංකමල්ල රජු
5) ගල්පොත සෙල්ලිපිය - සේනා සම්මත වික්‍රමබාහු රජු (.......)

★ අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/ දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන/දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිලිවලට නොවේ. X තීරය Y තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන් තුළ ලියන්න.

| | X තීරුව | Y තීරුව |
|---|---|---|
| (16) | 1) නිශ්ශංකමල්ල රජු | A. 1215 දී පොලොන්නරුව ආක්‍රමනය |
| | 2) කාලිංග මාඝ | B. පිතෘ ඝාතක |
| | 3) ලීලාවතී රැජින | C. ගල්පොත සෙල්ලිපිය |
| | 4) 1 වන කාශ්‍යප රජු | D. බදුලු ටැම් ලිපිය |
| | 5) හතරවන උදය රජු | E. තෙවරක් ශ්‍රී ලංකාවේ රජවීම |

1. CAEBD 2. ECABD 3. DCBAE 4. AEDCB 5. CABDE (.......)

| | | |
|---|---|---|
| (17) | 1) හෙන්රි වෝඩ් | A. කන්තලේ වැව |
| | 2) හර්කියුලිස් රොබින්සන් | B. නාච්චදූව වැව |
| | 3) විලියම් ග්‍රෙගරි | C. කලාවැව |
| | 4) ආතර් ගෝර්ඩන් | D. ඉරක්කාකම් වැව |
| | 5) වෙස්ට් රිජ්වේ | E. තිස්සමහාරාම වැව |

1. ADCBE 2. ECADB 3. DEACB 4. AEBCD 5. BEDCA (.......)

| | | |
|---|---|---|
| (18) | 1) සූරතිස්ස | A. මාඝ |
| | 2) වංකනාසික තිස්ස | B. කරිකාල චෝල |
| | 3) පළමුවන සේන | C. සේන හා ගුත්තික |
| | 4) පරාක්‍රම පාණ්ඩ්‍ය | D. ශ්‍රී මාර ශ්‍රී වල්ලභ |
| | 5) දෙවන පරාක්‍රමබාහු | E. චන්ද්‍රබානු |

1. AECDB 2. CBDAE 3. CDABE 4. BDACE 5. EDCAB (.......)

| | | |
|---|---|---|
| (19) | 1) උඩරට රාජ්‍ය යේ පළමු පාලකයා | A. පෙඩ්රික් නෝර්ත් |
| | 2) පළමුවන ලන්දේසි ආණ්ඩුකාරවරයා | B. හෙන්රි මන්ක් මේසන් මුවර් |
| | 3) පළමුවන බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා | C. විලියම් ගොපල්ලව |
| | 4) පළමුවන අග්‍රාණ්ඩුකාරවරයා | D. විලෙම් ජේ. කොස්ටර් |
| | 5) ප්‍රථම ජනාධිපති | E. සේනා සම්මත වික්‍රමබාහු |

1. AEBCD 2. BDCEA 3. ADCEB 4. EBCAD 5. EDABC (.......)

(20) 1) සපුමල් කුමරු — A. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

2) ටිකිරි කුමරු — B. දෙවන රාජසිංහ රජු

3) කොනප්පු බණ්ඩාර — C. හයවන බුවනෙකබාහු රජු

4) මහා අස්ථාන කුමරු — D. පළමුවන විමලධර්මසූරිය රජු

5) කන්නසාමි — E. පළමුවන රාජසිංහ රජු

1. ACBDE 2. BCDAE 3. EADBC 4. CEDBA 5. CDBAE (.......)

★ අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

(21) රජරට චෝල පාලනය

1) චෝලයන් විසින් පස්වන මහින්ද රජතුමා අල්ලාගෙන සිරකරුවකු ලෙස දකුණු ඉන්දියාවට ගෙනයන ලදී

2) ක්‍රි.ව. 1017 දී ලංකාවේ උතුරු ප්‍රදේශය චෝළ අධිරාජ්‍යයාගේ කොටසක් බවට පත්විය.

3) කාලිංස මාඝ ශ්‍රී ලංකාවේ අවසාන චෝළ පාලකයා විය.

4) චෝළ පරිපාලනය යටතේ පැවති ප්‍රදේශ මුම්මඩි චෝළ මණ්ඩලම් යනුවෙන් හැඳින්විය.

5) චෝළ පරිපාලනය මධ්‍යස්ථානය ජනනාථමංගලම් ලෙස හැඳින්වේ. (.......)

(22) බ්‍රිතාන්‍යයන් යටතේ වගු වගාව

1) කෝල්බෲක් කැමරන් යටතේ වතු ආර්ථිකයේ වර්ධනයට මග පෑදුණි.

2) හෙන්රි වෝඩ් විසින් පළමුවන කෝපිවත්ත ආරම්භ කරනු ලැබීය.

3) 1880 තෙක් වඩාත් වැදගත් වාණිජ බෝගය වූයේ කෝපිය.

4) වතු වගාවේ නැගීම ප්‍රවාහන පද්ධතියේ වර්ධනයක් ඇතිවීමට හේතු විය.

5) වතු වගාව ප්‍රධාන වශයෙන් සංක්‍රමණික ශ්‍රමය මත පදනම් විය. (.......)

(23) පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ ආගමික කටයුතු

1) වටදාගෙය කරවීම.

2) ගල්විහාර කතිකාවත පිහිටුවීම.

3) ආලාහන පිරිවෙන කරවීම.

4) තුන් නිකාය සමගි කරවීම.

5) අඹගමුව ග්‍රාමය ශ්‍රී පාදස්ථානයට පවරා දීම. (.......)

(24) ක්‍රි.ව. 1817 – 1818 බ්‍රිතාන්‍ය විරෝධී උඩරට නැගී සිටීම.

1) ටොරින්ටන් සාමි විසින් බදු වර්ග 30 ක් හඳුන්වා දීම.

2) ක්‍රි.ව. 1815 උඩරට ගිවිසුමේ වගන්ති කඩ කිරීම.

3) රජෙකු නොමැති අඩුපාඩුව හා කනස්සල්ල.

4) මඩිහේ මුහන්දිරම් තනතුරට හජ්ජිමරික්කාර් නම් මුස්ලිම් මුහන්දිරම්වරයෙකු පත් කිරීම.

5) දොරේ සාමි නම් පුද්ගලයෙක් රාජ්‍ය උරුමය ඇතැයි පවසමින් ඌව වෙල්ලස්සෙන් නැගී සිටීම (.......)

(25) මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය

1) ප්‍රොතෙස්තන්ත්‍ර දහම හඳුන්වා දීම.
2) මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දීම.
3) දෙමළ ජනයාගේ නීති හා සම්ප්‍රදායන් තේසවලාමෙයි නමින් සංග්‍රහ ගත කිරීම.
4) මුල්ලේරියා සටනින් අන්ත පරාජයකට පත්වීම.
5) ලැන්ඩ්රාද් උසාවි පිහිටුවීම (.......)

★ අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නය සඳහා (A), (B), (C), (D) හා (E) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරන්න.

(A) හා (B) පමණක් නිවැරදි නම් ............................................................ 1 ද,
(B) හා (C) පමණක් නිවැරදි නම් ............................................................ 2 ද,
(C) හා (D) පමණක් නිවැරදි නම් ............................................................ 3 ද,
(A) හා (C) පමණක් නිවැරදි නම් ............................................................4 ද,
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ............ 5 ද යොදන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) හා (B) පමණක් නිවැරදිය | (B) හා (C) පමණක් නිවැරදිය | (C) හා (D) පමණක් නිවැරදිය | (A) හා (C) පමණක් නිවැරදිය | එකක් හෝ දෙකකට වැඩි සංයෝගයක් නිවැරදිය |

(26) ශ්‍රී ලංකාවට සිදු වූ පෘතුගීසි බලපෑම සම්බන්ධව කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

A. කතෝලික ආගම මෙරට ප්‍රචාරය කිරීම
B. කතෝලික ආගම වැළඳගත් ශ්‍රී ලාංකිකයන්ට රජයේ පහළ නිලතල ලබාදීම
C. දිසාවන් හතරකට තම බල ප්‍රෙද්ශ බෙදා තිබුණි.
D. බටහිර ක්‍රමයේ අධ්‍යාපනයක් ඇති කිරීමට උත්සුක නොවීම (.......)

(27) යාපනය රාජධානිය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

A. කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජුට යටත්ව පැවතුනි.
B. දක්ෂතම පාලකයා වූයේ සංකිලි ය.
C. පෘතුගීසීන්ට එහි බලය ස්ථාපිත කර ගැනීමට නොහැකි විය.
D. ගම්පොළ රාජධානිය යටතේ යාපනය දුර්වලව පැවතුනි (.......)

(28) බ්‍රිතාන්‍යයන් යටතේ පුරාණ වාරි කටයුතු ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදිද?

A. බ්‍රවුන්රිග් ඌරු බොක්ක හා කිරිම වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කළේය.
B. වෝර්ඩ් වියලි කලාපයේ පුරාණ වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කළේය.
C. ග්‍රෙහරි ගම් වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කළේය.
D. ගෝර්ඩන් කලා වැව ප්‍රතිසංස්කරණය කළේය. (.......)

(29) දහසය වන සියවසේ කෝට්ටේ රාජධානිය සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

A. රයිගම් බණ්ඩාරගේ මරණින් පසුව ඔහුගේ පාලන ප්‍රදේශය හත්වන බුවනෙකබාහු කෝට්ටේ රාජ්‍යයට ආදා ගැනීම.

B. 1521 දී ඇති වූ විජයබා කොල්ලයේ ප්‍රතිඵලයක් ලෙස කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙදී ගියේය.

C. 1565 දී පෘතුගීසීන් ධර්මපාල රජු කොළඹට කැටුව යාමෙන් පසු එතෙක් අගනුවර වූ කෝට්ටේ අතහැර දමනු ලැබීය.

D. කතෝලික ආගම වැළඳගත් මුල්ම කෝට්ටේ පාලකයා හත්වන බුවනෙකබාහු රජුය (.......)

(30) ලංකා ජාතික සංගමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවාරදි වේද?

A. පොන්නම්බලම් රාමනාදන් මහතා මෙම සංගමයේ ප්‍රථම සභාපතිවරයා විය.

B. මෙම සංගමයේ ප්‍රධාන අරමුණ වූයේ සර්වජන ඡන්දබලය දිනාගැනීමය.

C. ලංකා ජාතික සංගමය 1919 දී පිහිටුවන ලදී.

D. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා මෙම සංගමයේ ලේකම්වරයෙකු විය. (.......)

★ අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

(31) සපුමල් කුමාරයා විසින් පරාජය කරන ලද ආර්ය චක්‍රවර්ති පාලකයා කවුද?

1) ජයවීර ශිංගෙයාරින් 2) කුණවීර ශිංගෙයාරියන්
3) කණකශූරි ශිංගෛයාරින් 4) පරරාජසේකරම් 5) සංකිලි (.......)

(32) ලම්භකර්ණ පෙළපතේ පළමුවන පාලකයා කවුද?

1) ධාතුසේන රජතුමා 2) ගජබාහු රජු
3) ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා 4) වසභ රජතුමා 5) ගෝඨාභය රජතුමා (.......)

(33) ජාතක කථාපොත සිංහලයට පරිවර්තනය කළ යුගය කුමක්ද?

1) කුරුණෑගල 2) දඹදෙනිය 3) යාපහුව
4) ගම්පොළ 5) කෝට්ටේ (.......)

(34) ශ්‍රී ලංකාවේ ප්‍රථම කථානායකවරයා කවුද?

1) ඩී.එස්. සේනානායක 2) සර් ජෝන් කොතලාවල
3) එන්.එම්. පෙරේරා 4) ජේ.ආර්.ජයවර්ධන 5) ඒ.එෆ්. මෝලමුරේ (.......)

(35) මෙරටට සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක්ද?

1) කෝල්බෲක් 2) ඩොනමෝර්
3) මැනිං 4) මැනිං ඩෙවොන්ෂයර් 5) සෝල්බරි (.......)

★ අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය | වැරදි ය |
| 2 | නිවැරදි ය | නිවැරදි ය |
| 3 | වැරදි ය | වැරදි ය |
| 4 | වැරදි ය | නිවැරදි ය |
| 5 | නිවැරදි ය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36 | ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා ජූරි සභා ක්‍රමය හඳුන්වා දෙන ලදී. | 1810 අධිකරණ ප්‍රඥප්තිය මගින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු ඇසීම සම්බන්ධයෙන් ජූරි සභා ක්‍රමය හඳුන්වා දෙනු ලැබූහ. | (.......) |
| 37 | පළමු නිකාය භේදය වට්ටගාමිණී අභය රාජ්‍ය සමයේදී සිදු විය | මහායාන ධර්මය කූටකණ්ණාභය රාජ්‍ය සමයේදී ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී | (.......) |
| 38 | හජ්ජි මරික්කාර් මුහන්දිරම් වරයෙකු ලෙස පත් කිරීම හේතු කරගෙන 1915 සිංහල මුස්ලිම් කෝලාහලය ඇතිවිය | ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් මහතා ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා විය. | (.......) |
| 39 | මහාවංශයට අනුව මහාසේන රජතුමා 'බොහෝ පින් ද බොහෝ පව් ද' රැස්කර ගත්තේය. | මහා විහාරය විනාශ කරන ලද්දේ වී නමුත් මහසේන රජතුමා අති දැවැන්ත ජේතවන දාගැබ හා මින්නේරි ඇතුළු විශාල වැව් ගණනාවක්ම කරවිය. | (.......) |
| 40 | ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගන්නා ලද්දේ 1955 වර්ෂයේදී ය. | එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා 1951 ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවනු ලැබීය. | (.......) |

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: ලංකා ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 03 |

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

උපදෙස් :

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නයටත්, B හා C ලෙස කොටස්වලින් අවම වශයෙන් එක ප්‍රශ්නය බැගින් තෝරාගෙන තවත් ප්‍රශ්න තුනකටවත් පිළිතුරු සපයන්න.
  (පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් සපයා ඇත.)

---

## A කොටස

(01) ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | |
|---|---|---|
| 1. මැණික් ගඟ | 2. ඌව පළාත | 3. දෙවිනුවර |
| 4. නාච්චදූව | 5. දඹකොළ පටුන | 6. ගන්නෝරුව |
| 7. පාහියන්ලෙන | 8. මහාතිත්ථ වැව | 9. හුරුළු වැව |
| 10. සීගිරිය | 11. මුල්ලේරියාව | 12. යාන්ඔය |

(නිවැරදිව ලකුණු කිරීමකට ලකුණු 01 බැගින්)

## B කොටස

(02) ‘මහා වංශයේ මුල් කොටස මහා විහාරයේ වංශ කතාව යි’.

1. මහාවංශ කතුවරයා නම් කරන්න. (ල 01)
2. මහාවංශයට ලියන ලද ටීකාව කුමක් ද? (ල 01)
3. මහාවිහාරයට අයත් වූ ප්‍රධාන උපෝසථාගාරය හා ස්තූපය නම් කරන්න. (ල 02)
4. මහා විහාරය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල 04)
5. මහාසේන රාජ්‍ය සමයේ අවසානය තෙක් ආගමික හා දේශපාලනික දෙඅංශයේම ඉතිහාසය හැදෑරීමෙහිලා මහාවංශයේ ඇති වැදගත්කම විමසන්න. (ල 08)

(03) වට්ටගාමිනී අභය රාජ්‍ය සමයේ වැදගත්කම පහත මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.

1. මුහුණ දීමට සිදු වූ දේශීය හා විදේශීය අභියෝග හා ඒවා ජයගත් ආකාරය
2. අභයගිරිය පිහිටුවීම.
3. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම. (ල 16)

(04) පොළොන්නරු යුගයේ පරිහානිය හා බිඳ වැටීමට බලපෑ ප්‍රධාන සාධක විචාරාත්මකව විමසන්න. (ල 16)

(05) දඹදෙණි යුගයේ වැදගත්කම පහත දැක්වෙන තේමා ඇසුරින් පරීක්ෂා කරන්න.

1. දඹදෙණි රාජධානිය පිහිටුවීම.

2. විදේශීය ආක්‍රමණ පරාජය කිරීම.

3. සංස්කෘතික ප්‍රබෝදය (ල 16)

## C කොටස

(06) 1. උඩරට රාජධානිය ආක්‍රමණය කිරීමට පෘතුගීසීන් පෙළඹ වූ සාධක පරීක්ෂා කරන්න. (ල 08)

2. එම ආක්‍රමණ අසාර්ථක වූයේ මන්ද? (ල 08)

(07) 'බ්‍රිතාන්‍යයන් යටතේ වගු වගාවේ ව්‍යාප්තිය ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ මූලික පරිවර්තනයක් ඇති කළේය.'

1. ශ්‍රී ලංකාවේ පළමුවරට කෝපි වත්තක් ආරම්භ කල ඉංග්‍රීසි ජාතික විචැලිකරුවා නම් කරන්න. (ල 01)

2. දහනමවන සියවසේ දී වගා කරන ලද ප්‍රධාන වාණිජ බෝග දෙකක් සඳහන් කරන්න. (ල 02)

3. වතු වගාවේ ආරම්භයට උපකාරී වූ කෝල්බෲක් කොමිසමේ ආර්ථික යෝජනා සැකවින් දක්වන්න. (ල 04)

4. දහසය වන සියවසේ වතු වගාවේ ව්‍යාප්තිය ඇසුරින් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රෙය් මූලික පරිවර්තනයක් සිදුවූ අයුරු පරීක්ෂා කරන්න. (ල 09)

(08) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ල 16)

(09) පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක සංස්කෘතික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා


2. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ

3. 1818 ප්‍රථම නිදහස් සටන

4. ගොවි ජනපද ව්‍යාපාරය (ල 16)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!






(19) WWW.PastPapers.WiKi (19)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: ලංකා ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | පැය / மணித்தியாலம் / Hours: 03 |

පිළිතුරු පත්‍රය

I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 11 - 3 | 21 - 3 | 31 - 3 |
| 2 - 5 | 12 - 4 | 22 - 2 | 32 - 4 |
| 3 - 4 | 13 - 1 | 23 - 5 | 33 - 1 |
| 4 - 4 | 14 - 2 | 24 - 1 | 34 - 5 |
| 5 - 2 | 15 - 5 | 25 - 4 | 35 - 2 |
| 6 - 4 | 16 - 1 | 26 - 4 | 36 - 4 |
| 7 - 1 | 17 - 3 | 27 - 1 | 37 - 1 |
| 8 - 2 | 18 - 2 | 28 - 5 | 38 - 3 |
| 9 - 5 | 19 - 5 | 29 - 2 | 39 - 5 |
| 10 - 3 | 20 - 4 | 30 - 3 | 40 - 2 |

(ලකුණු 1 X 40 = 40 යි)


II කොටස

A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | |
|---|---|---|
| I. මැණික් ගඟ | II. දෙවිනුවර | III. ඌව පළාත |
| IV. නාච්චදූව වැව | V. ගන්නෝරුව | VI. පාහියන් ලෙන |
| VII. හුරුලු වැව | VIII. මහාතිත්ථ | IX. සීගිරිය |
| X. යාන් ඔය | XI. මුල්ලේරියාව | XII. අනුරාධපුරය |

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)


මහාතිත්ථය
යාන් ඔය
අනුරාධපුරය
නාච්චදූව
හුරුළු වැව
සීගිරිය
ගන්නෝරුව
ඌව පළාත
මුල්ලේරියාව
පාහියන්ගල
මැණික් ගඟ
දෙව්නුවර
N

B කොටස

2. "මහාවංශයේ මුල් කොටස මහා විහාරයේ වංශකථාවයි"

I. දික්සඳ සෙනෙවියා පිරිවෙනෙහි විසූ මහානාම හිමි (ල.1)

II. වංසත්තප්පකාසිනි (ල.1)

III. ලෝවාමහාප්‍රාසාදය
ථූපාරාමය (ල.2)

IV.

- දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ මිහිඳු හිමියන් මෙරටට ගෙන එන ලද පිරිසිදු ථේරවාදී බුදු දහමේ - මධ්‍යස්ථානය මහා විහාරයයි.
- මහමෙවුනා උයනේ පිහිටුවා ඇත.
- දේවානම්පියතිස්ස රජු විසින් රන් නගුලකින් එහි සීමා දක්වා සංඝයා වහන්සේලාට පූජා කිරීම.
- එය ප්‍රථම ආරාම පූජාව වීම.
- මහා විහාර සීමාවේ ථූපාරාමය හා ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩ සිටියි.
- එම විහාර සීමාවේ ඉදි විය යුතු හා අනාගතයේදී ඉදිවීමට නියමිත ඉදිකිරීම් සඳහා මිහිඳු හිමි ප්‍රකාශ කර තිබීම.
- දුටුගැමුණු රජු එම සීමාවේ රුවන්වැලි සෑය ලෝවාමහාප්‍රාසාදය ඉදි කිරීම.
- මහාවංශය ලියූ මහානාම හිමි මහා විහාරික භික්ෂුවක් විය.
- මහා විහාරය මිහිඳු හිමි විසින් ගෙනෙන ලද ථේරවාදී බුදු දහමේ ප්‍රධාන කේන්ද්‍රස්ථානය වීම.

(ල.4)

V.

- ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධීන් අඛණ්ඩව වාර්තා කොට ඇති වටිනාම ග්‍රන්ථය වීම.
- බුදුන් වහන්සේ ලංකාගමනයේ සිට මහසෙන් රාජ්‍ය සමයේ අවසානය දක්වා තොරතුරු අඩංගු වීම.
- ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ මහානාම හිමි රචනා කරන ලද අතර ශ්‍රී ලංකාවේ පැරණිම වැදගත් සාහිත්‍ය මූලාශ්‍රය වීම.
- පරිච්ඡේද තිස් හතකින් සමන්විත වන අතර එයින් පරිච්ඡේද 11ක්ම දුටුගැමුණු රජතුමා වෙනුවෙන් වෙන්කර තිබීම.
- මිහිඳු හිමියන්ගේ පැමිණීමේ අවස්ථාවේ සිට දේවානම්පියතිස්ස රජු බුදු දහම ව්‍යාප්තියට ගත් වෙහෙස මෙහි විස්තර කර තිබීම හා සංඝමිත්තා තෙරණිය පැමිණීම ආදී පිළිබඳ තොරතුරු මිහින්තලා, රජගල ආදී සෙල් ලිපි වලින් මෙන්ම වෙනත් මූලාශ්‍ර හා නටබුන්වලින් හෙළිවීම.
- දුටුගැමුණු රජතුමාගේ දස මහා යෝධයන් ගැන හා එතුමාගේ සේවාව සිතුල්පව්ව වැලඑල්ලුගොඩ සෙල්ලිපි වලින් විස්තර වේ.
- මහා විහාරයට සේවා කළ රජුන් වර්ණනා කිරීම මහා විහාරයට විරුද්ධ වූ මහාසයෙන් වැනි රජවරු ගැන තොරතුරු අඩුවෙන් ලියා තිබීම.
- වළගම්බා වැනි ශ්‍රේෂ්ඨ රජවරු සතුරන්ගේ රට බේරා රට එක්සේසත් කළද මහා විහාරයට විරුද්ධව කටයුතු කිරීම නිසා ඔවුන් පිළිබඳ අඩුවෙන් විස්තර ලිවීම.
- ශ්‍රී ලංකාවේ ස්ථාන නාම, රාජ නාමාවලිය, පුද්ගල නාම වැනි වැදගත් තොරතුරු සනාථ කර ගැනීමට හැකිවීම.
- කර්මාන්ත පිළිබඳ, රැකියා පිළිබඳ වැනි ආර්ථික තොරතුරු ද මෙහි සඳහන් වී තිබේ.

(ලකුණු 8)

3. දේශීය හා විදේශීය අභියෝග හා එතුමා ඒවා ජයගත් අන්දම

- අනුරාධපුර යුගයේ රජකළ වැදගත් පාලකයෙකි.
- රජ පවුලට ඇති වූ කුමන්ත්‍රණයක් පරදවා රාජ්‍යත්වයට පත්වීම. (මහාරත්තක සෙනවියා මරා රජවීම.)
- ක්‍රිස්තු පූර්ව 103 දී රජකමට පත් වුවත් ඉතා කෙටි කලකින් ඇති වූ අභ්‍යන්තර කැරැල්ලකට මුහුණ දීම. නකුල නගරයේ තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ලයි.
- දකුණු ඉන්දියාවෙන් සත්ද්‍රවිඩ ආක්‍රමණයක් ඇතිවීම.
- එම ආක්‍රමණයට මුහුණ දීමට තරම් සේනා සංවිධානයක් නොතිබීම නිසා රජු පලා යාම.
- ගිරි නම් නිගණ්ඨයා මහා කළු සිංහලයා පලා යනවා යයි රජුට අවමන් කිරීම.
- සත් ද්‍රවිඩයන්ගෙන් එක් අයකු සෝමා දේවිය හා පාත්‍රා ධාතුව රැගෙන යාම.
- වනගතව නොයෙක් ස්ථානවල කල්ගත කිරීම.
- කුපික්කලතිස්ස භික්ෂුව ඇතුළු භික්ෂූන් රජුට උදව් උපකාර කිරීම.
- තනසීව නම් ප්‍රාදේශීය නායකයාගේ සහාය ලැබීම.
- වසර 12 ක බැමිණිතියා නම් සහගතයක් පැවතීම.
- සේනා සංවිධානය කර සතුරා පරාජය කිරීම.

අභයගිරි විහාරය පිහිටුවීම.

- ක්‍රිස්තු පූර්ව 89 දී දාඨිය නම් ද්‍රවිඩයා මරා අනුරාධපුරයේ රජවීම.
- ගිරි නිගණ්ඨයා වාසය කළ ආරාමය තනා එම ස්ථානය අභයගිරි ස්තූපය ඉදිකිරීම.
- තමාට උපකාර කළ කුපික්කලතිස්ස හිමිට එම විහාරය පූජා කිරීම.
- මහා විහාරික භික්ෂූන් මෙයට විරුද්ධ වීම.
- මහාතිස්ස තෙරුන් ඇතුලු භික්ෂූන් පන්සීයක් මහා විහාරයෙන් ඉවත් වී අභයගිරියේ පදිංචි වීම.
- මෙම ක්‍රියාව නිසා ලංකාවේ ප්‍රථම නිකාය භේදයක් හට ගැනීම.
- මහායාන අදහස් අභයගිරියේ ව්‍යාප්තවීම.
- අභයගිරිය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් වීම.
- විදේශීය ගිහි පැවිදි උගතුන් අධ්‍යාපනයට පැමිණීම. උදාහරණ : පාහියන් හිමි

ත්‍රිපිටකය ගන්ථාරූඪ කිරීම

- . අවුරුදු 12 ක් තිස්සේ පැවති බැමිණිතියා සාගතයද බුදු දහමේ පැවැත්මට බාධා වීම.
- එකල ත්‍රිපිටකය රැගෙන ආවේ මුඛ පරම්පරා ගතවීම.
- මෙසේ ආරක්ෂා කරගෙන ආ ත්‍රිපිටකය අභාවයට පත්වීමේ තර්ජනයක් මතුවීම.
- භික්ෂූන් වහන්සේලාට ආහාර නොමැතිවීම නිසා අපවත් වීම, සිවුරු හැරීම ආදිය සිදුවීම.
- මෙම නිසා වට්ටගාමිණී අභය රජුගේ කාලයේදී ප්‍රාදේශීය නායකයෙකුගේ අනුග්‍රහය යටතේ ත්‍රිපිටකය ගාථාරූඪ වීම.

(ලකුණු 16)

4. පොළොන්නරු යුගයේ පරිහානිය හා බිඳවැටීම.

- දුර්වල පාලනය - පොළොන්නරුවේ සිටි දක්ෂ රජුන් තිදෙනාගෙන්ම අවසානයා වූ නිශංකමල්ල රජුගෙන් පසු දේශීය හා විදේශීය බලපෑ කරුණු නිසා අවසාන පාලකයා වූ පරාක්‍රම පාණ්ඩෙ රජුගේ පාලනය දුර්වල වීම.
- කාලිංග මාඝ ආක්‍රමණය - 1215 කාලිංග මාඝගේ ආක්‍රමණය.
- කාලිංග හා පාණ්ඩ්‍ය පෙළපත් අතර ගැටුම්.
- වෙනත් ප්‍රදේශවලට ජනයා සංක්‍රමණය වීම නිසා එම ප්‍රදේශ ජනශූන්‍ය වීම.
- වාරිමාර්ග බිඳ වැටීම.
- ගොවිතැන් කටයුතු අඩපණ වීම නිසා ආර්ථික පරිහානිය.

(ලකුණු 16)

5. දඹදෙණි රාජධානිය පිහිටුවීම.
   - මෙරට තුන්වන පාලන මධ්‍යස්ථානය වූ අතර රාජධානි මාරුවේ ප්‍රථම රාජධානිය වීම.
   - වන්නි නායකයකු ලෙස කටයුතු කළ තුන්වන විජයබාහු රජු තම බලය ස්ථාපිත කර ගැනීම.
   - මාඝගේ සේනාව පහර දී මුළු මායා රටම මාඝගෙන් ගලවා ගැනීම.
   - අවුරුදු හතරක් රජ වීම.
   - කොත්මලේ සඟවා තිබූ දන්ත ධාතුව දඹදෙණියට වඩමවා බෙලිගල දළදා මැදුරක තැන්පත් කිරීම.
   - තුන්වන විජයබාහුගෙන් පසු දෙවන පරාක්‍රමබාහු, හතරවන විජයබාහු යන පාලකයන් දඹදෙණියේ රජවීම.

   විදේශීය ආක්‍රමණ පලවා හැරීම.

   - ජාවක චන්ද්‍රබානුගේ පළමු ආක්‍රමණය මැඩ පැවැත්වීම.
   - වසර හතළිහක මාඝගේ පාලනය නිම කරමින් පොළොන්නරුව බේරාගැනීම.
   - ජාවක චන්ද්‍රබානුගේ දෙවන ආක්‍රමණය මැඩ පැවැත්වීම.
   - පාණ්ඩ්‍ය  දේශයේ ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය  රජුගේ උදව් ලබා ගැනීම.

   සංස්කෘතික ප්‍රබෝධය.

   - බෙලිගල තැන්පත් කර තිබූ දන්තධාතූන් වහන්සේ දඹදෙණියට වැඩම කරවීම.
   - ශාසනයට හිමි ගම්බිම් නැවත සංඝයා සතු කිරීම.
   - වාර්ෂික දළදා පෙරහැර පැවැත්වීම.
   - විනාශ වී ගිය පොත්පත් ලිවීමට තුන්වන විජයබාහු මෙන්ම දෙවන පරාක්‍රමබාහු රජුද රාජ්‍ය අනුග්‍රහය ලබා දීම.
   - උපසම්පදා උත්සව පැවැත්වීම.
   - ශාසන සංශෝධනය සඳහා දඹදෙණි කතිකාවත කරවීම. දෙවන පරාක්‍රමබාහු රජු උගතෙකු මෙන්ම පඬිවරයෙක්ද වූ අතර කව්සිළුමිණ, විසුද්ධිමාර්ග සන්නස වැනි ග්‍රන්ථ රචනා කිරීම.
   - ග්‍රන්ථකරණයට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.

(ලකුණු 16)

C කොටස

6.

I. උඩරට ආක්‍රමණය කිරීමට පෘතුගීසීන් පෙළඹ වූ සාධක.

- ආගම ප්‍රචාරය කිරීම හා ආර්ථික වාසි ලබා ගැනීමට පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීම.
- මෙරට තිබූ දේශපාලන වියවුල් තත්ත්වයෙන් ප්‍රයෝජන ගත් පෘතුගීසි මෙරට දේශපාලන ආධිපත්‍ය පිහිටුවීම.
- කන්ද උඩරට කරලියද්ද බණ්ඩාර රජු පෘතුගීසීන්ගෙන් උදව් ලබාගෙන රජවීම.
- රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කිරීමේදී කරලියද්ද බණ්ඩාර රජු තම දියණිය හා බෑනා සමග පෘතුගීසීන් වෙත පලායාම.
- කුසුමාසන දේවිය මාර්ගයෙන් උඩරට අල්ලා ගැනීමට කටයුතු කිරීම.
- වීරසුන්දර බණ්ඩාරව පළවන රාජසිංහ රජු මරා දැමීම නිසා ඔහුගේ පුත් කොනප්පු බණ්ඩාර පෘතුගීසීන් වෙත පලායාම.
- කොනප්පු බණ්ඩාර පළවන විමලධර්මසූරිය නමින් උඩරට රජ වී පෘතුගීසීන්ගෙන් උඩරට බේරා ගැනීම.
- උඩරට ආක්‍රමණයට පෘතුගීසීන් අවස්ථා කිහිපයකදීම උත්සාහ දැරීම.

1594 දන්තුරේ සටන - පේරෝ ලෝපේස් ද සූසා හා පලවන විමලධර්මසූරිය අතර
1602 බලන සටන - දොන් ජිරනිමෝද අසවේදු හා පළවන විමලධර්මසූරිය අතර
1630 රන්දෙනිවෙල සටන - කොන්ස්කන්තිනූද සා හා සෙනරත් රජු හා මහා අස්ථාන කුමරු අතර
1638 ගන්නෝරු සටන - දියෝගෝද මේලෝ හා දෙවන රාජසිංහ රජු අතර
මෙම සියලු ආක්‍රමණවලින් පෘතුගීසීන් පරාජය වීම. පෘතුගීසි නායකයින්ද සමූල ඝාතනය විය.

(ලකුණු 8)

II. එම ආක්‍රමණ සාර්ථක වීමට හේතු.

- උඩරට ස්වභාවිකව පිහිටීම. - ගිනිදුර්ග, වනදුර්ග, ජල දුර්ග සිංහලයින්ගේ ගරිල්ලා සටන් ක්‍රම.
- දක්ෂ රජවරු උඩරට බලයට පත්වීම හා ඔවුන්ගේ උපක්‍රමශීලී බව.
- සිංහල ජනයාගේ රාජපාක්ෂික භාවය.
- වැසි කාලය ආරම්භ වීම නිසා ආහාර හිඟය, ලෙඩ රෝග පැතිර යාම.
- ලස්කිඤ්ඤා හමුදාව තීරණාත්මක අවස්ථාවලදී රජුට පක්ෂපාතී වීම.

(ලකුණු 8)

7.

I. ජෝර්ජ් බර්ඩ් (ලකුණු 1)

II. තේ, රබර්, සිංකෝනා, කොකෝවා. (ලකුණු 2)

III.

- උඩරට හා පහතරට ඒකාබද්ධ කිරීම නිසා උඩරට හා පහතරට යාමට පහසු වීම.
- ඉඩම් විකිණීමේ ක්‍රමයක් ආරම්භ කිරීම.
- 1810 අංක 12 දරණ මුඩුබිම් පනත ඇති කිරීම.
- යුරෝපා ජාතීන් ලබාගත් ඉඩම් අවුරුදු පහකට බදු වලින් නිදහස් කිරීම.
- අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
- රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම.
- ඉතිරි කිරීමේ බැංකු ඇරඹීම, ණය පහසුකම් ලබා දීම.

(ලකුණු 4)

IV. ආර්ථික පරිවර්තනය.

- වාණිජ භෝග වගා කිරීම හා රජයේ අනුග්‍රහය ලබාදීම.
- ධනවාදී ආර්ථික රටාවකට අවශ්‍ය පදනම් සැකසීම.
- රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම.
- වතු වගාව ආශ්‍රිත රැකියා බිහිවීම.
- ඉන්දියානු ශ්‍රමිකයින් ගෙන්වා ගැනීම.
- මධ්‍යම පංතියක් බිහිවීම.
- මහා මාර්ග හා දුම්රිය මාර්ග ඉදිවීම.( වතු නිෂ්පාදන වරායන් වෙත ගෙනයාම)
- ආනයන අපනයන ආර්ථිකය දියුණු වීම.

(ලකුණු 9)

8. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ:

- ශ්‍රී ලංකාව, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය යනුවෙන් හැඳින්වීම.
- ජනතාව වෙත පවරා ඇති පරමාධිපත්‍ය බලය මැතිවරණ හා ජනමත විචාරණය මගින් ක්‍රියාත්මක වීම.
- උත්තරීතර නීතිය රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බව.
- පාර්ලිමේන්තුව පිහිටුවීම.
- විධායක ජනාධිපති ධූරය හඳුන්වා දීම.
- ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ හා වෙනත් බලතල රාශියක් ජනාධිපතිවරයා සතුවීම.
- ජනාධිපති ධූරයේ සිටින තාක්කල් කිසිම උසාවියකින් එතුමාට එරෙහි නඩු පැවරිය නොහැකිවීම.

- ස්වාධීන අධිකරණ පද්ධතියක් හඳුන්වාදීම.
- මූලික මිනිස් අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කිරීම.
- අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය.

(ලකුණු 16)

9.

A. කීර්ති ශ්‍රී රාජසිංහ රජු

- ක්‍රිස්තු වර්ෂ 1747- 1781 දක්වා උඩරට රාජ්‍ය පාලනය කිරීම.
- ක්‍රිස්තු වර්ෂ 1750 වන විට රජු හා ලන්දේසීන් අතර සබඳතා ගැටුම්කාරී තත්ත්වයකට පත්වීම.
- කීර්ති ශ්‍රී රාජසිංහ රජු පහතරට ආක්‍රමණය කර ලන්දේසි සතු හංවැල්ල හා මාතර බලකොටු අල්ලා ගැනීම.
- 1762 දී ජෝන් පයිබස් නම් ඉංග්‍රීසි දූතයා රජු හමුවීමට පැමිණීම.
- ලන්දේසීන් උඩරට ආක්‍රමණය කිරීම.
- 1766 දී ලන්දේසීන් සමග ගිවිසුමක් අත්සන් කිරීම.
- මෙය උඩරට රාජධානියට අවාසි සහගත ගිවිසුමක් වීම. සියම් රටින් උපසම්පදාවට භික්ෂූන් ගෙන්වීම.
- සියම් නිකාය පිහිටුවීම. වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය ලබාදීම.
- දෙවියන් උදෙසා පැවැත්වූ ඇසළ පෙරහැරට දළදා පෙරහැර සම්බන්ධ කිරීම.
- පහතරට වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය.

( ලකුණු 8)

B. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ.

- 1931 ඩොනොමෝර් සාමිගේ ප්‍රධානත්වයෙන් ඩොනමෝර් ප්‍රසංස්කරණය හඳුන්වාදීම.
- 1924 මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණයේ ව්‍යවස්ථාදායක සභාව තුළ බලය හා වගකීම බෙදී පැවතීම නිසාත් ස්වදේශිකයන් සෑහීමකට පත් නොවීම නිසා මෙම කොමිසම පත් කර එවනු ලැබිය.
- එහි ප්‍රධාන ලක්ෂණය වූයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවක් පිහිටුවීම.
- විධායක කාරක සභා ක්‍රමයක් හඳුන්වා දීම.
- සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම .
- ආණ්ඩුකාරවරයාගේ බලතල සීමා සහිත වීම.
- රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු පත් කිරීම. මුදල් ලේකම්, නීති ලේකම්, රාජ්‍ය ලේකම්

(ලකුණු 8)

C. 1818 ප්‍රථම නිදහස් සටන.

- උඩරට ගිවිසුමේ 5 වන වගන්තිය වූ බුද්ධාගම, දේවාගම ආරක්ෂා කිරීම පිළිබඳ වගන්තිය කඩකිරීම.
- රජෙකු නැති අඩුපාඩුව හා පසුතැවිල්ල.
- රදල ප්‍රධානීන්ගේ බලතල හා වරප්‍රසාද කඩ කිරීම.
- ඌවවෙල්ලස්ස ප්‍රදේශයට මඩිගේ මුහුදිරම් තනතුරට හජ්ජි මරිකාල් නම් මුස්ලිම් මුහන්දිරම් කෙනෙකු පත් කිරීම.
- භික්ෂූන් වහන්සේලාට හා රදළවරුන්ට නිසි ගෞරවය නොදැක්වීම
- දොරේ ස්වාමි නම් පුද්ගලයෙකු රාජ්‍ය උරුමය ඇති බව පවසමින් ඌව වෙල්ලස්සෙන් නැගී සිටීම.
- කැප්පෙටිපොළ, මඩුගල්ල ඇතුළු රදල ප්‍රධානීන් මෙම සටනට එක්වීම.
- මහනුවර, හාරිස්පත්තුව වැනි ප්‍රදේශවල කැරැල්ල ව්‍යාප්තවීම.
- ඉංග්‍රීසින් බිම් පාලු ප්‍රතිපත්තිය, මාෂල් ලෝ යුධ නීතිය පනවා සටන මර්දනය කිරීම.
- නායකයින් මරා දැමීම, අත්අඩංගුවට ගැනීම, දේපළ රාජ සන්තක කිරීම.

( ලකුණු 8)

D. ගොවිජනපද ව්‍යාපාරය.



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

- 1931 ඩොනමෝර් ක්‍රමය යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය ලාංකික ඇමතිවරුන්ට ලැබීම.
- ඩී.එස්.සේනානායක මහතා කෘෂිකර්ම ඇමතිවරයා ලෙස පත්වීම.
- වියළි කලාපය කෘෂිකර්මාන්තයට නැවත යොදා ගැනීම.
- වියළි කලාපයේ ගොවිජනපද ව්‍යාපාරය ආරම්භ කිරීම.
- තෙත් කලාපයේ ජනගහනය තදබලය ඉවත් කිරීම, රැකියා ලබාදීම, ඉඩම් හිමි ගොවි පරපුරක් බිහි කිරීම, කෘෂිකර්මාන්තය දියුණු කිරීම මෙහි අරමුණු වීම.
- ගොවිජනපදවලට අවශ්‍ය පහසුකම් ලබා දීම. (ජලය, විදුලිය, සන්නිවේදනය, අධ්‍යාපන පහසුකම්, රෝහල්)

(ලකුණු 8)


(18) www.PastPapers.WiKi (18)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!